# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2399/26 – 2024 අගෝස්තු මස 27 වැනි අඟහරුවාදා – 2024.08.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2018/191.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2021.03.08 වැනි දින අංක 2218/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.03.02 වැනි දින දරන නියෝගයෙන්,

පී. පද්මිණී ප්‍රනාන්දු මිය, අංක 02/02, දහම් පාසැල් මාවත, වැවල - පිළියන්දල.

*සහ*

ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය, අංක 37, මොරගහහේන පාර, පිට්පන, හෝමාගම.

අතර පවත්නා 2021.03.01 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ජනජිත් ද සිල්වා මයා වෙත යොමු කරන ලදී.

බේරුම්කරු නීතිඥ ජනජිත් ද සිල්වා මයා බේරුම්කාර ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2021.03.02 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

EOG 08- 319/1


1A – G 042585 – 14 (2024/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2018/191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

පී. පද්මිණී ප්‍රනාන්දු මිය, අංක 02/02, දහම් පාසැල් මාවත, වැවල - පිළියන්දල.

සහ

ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය, අංක 37, මොරගහහේන පාර, පිටිපන, හෝමාගම.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමඟ, 34/64, ඒ. බී. හේරත් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 අගෝස්තු මස 01 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2018/191.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. පද්මිණී ප්‍රනාන්දු මිය, අංක 02/02, දහම් පාසැල් මාවත, වැවල - පිළියන්දල.

සහ

ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලය, අංක 37, මොරගහහේන පාර, පිටිපන, හෝමාගම.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

"ශ්‍රී ලංකා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ 2011.01.03 සිට 2016.01.03 දක්වා මූල්‍යාධිකාරී ලෙස සේවය කළ පී. පද්මිණී ප්‍රනාන්දු මියගේ සේවය ස්ථිර නොකිරීම නිසා ඇයට අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජුලි මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0319/2

මගේ අංකය: IR/COM/03/2020/111.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ඩී. එම්. දිසානායක මහතා, අරළුපිටිය, ඇකිරියන්කුඹුර, බිබිල.

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මත්තේගොඩ, කුඩමාදූව, ද විලේජ්, අංක 202/බී/61, නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2024 ජූලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2020/111.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඩී. එම්. දිසානායක මහතා, අරළුපිටිය, ඇකිරියන්කුඹුර, බිබිල.

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු ලෙස සේවය කරන ඩී. එම්. දිසානායක මහතාගේ සේවය අත්හිටුවා ඔහුට විරුද්ධව සිදු කළ විනය පරීක්ෂණයෙන් අනතුරුව 2016.06.23 දිනැති විනය නියෝගයෙන් මාසයක කාලයකට සේවය තාවකාලිකව අත්හිටුවීම දඬුවමක් ලෙස දී තිබියදී එම විනය නියෝගය ප්‍රමාද වී ලැබීම නිසා ඩී. එම්. දිසානායක මහතාට මාස 06 කට අධික කාලයක් සේවයට වාර්තා කිරීමට නොදීම මගින් ඔහුට අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න සහ එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 03 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 08 – 0320

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.